# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

## அரச கணக்குகள் திணைக்களம்

## Department of State Accounts


| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2017.12.29 |
|---|---|---|---|

**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 262/2017**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් වෙත

**විශ්‍රාමගනු ලබන හා මියගිය නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් ශේෂ පියවා ගැනීම.**

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සම්බන්ධයෙන් සිදු කරන ලද තොරතුරු කැඳවීම මගින් විශ්‍රාමගිය හා මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය විශාල ප්‍රමාණයක් තවදුරටත් අය නොවී ගිණුම් තුල පවතින බව හඳුනාගෙන ඇත. නිලධාරීන් විශ්‍රාම යන අවස්ථාවේදි අදාල ණය ශේෂ පියවා ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිලධාරියාගේ විශ්‍රාම/ මරණ පාරිතෝෂික ගෙවන අවස්ථාවේදීම ණය අය කර ගැනීමට අවශ්‍ය ගිණුම් සටහන් තැබීම සඳහා ප්‍රතිපාදන නිදහස් කරනු ලබන අතර ඒ බව අදාල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්, ගණන් දීමේ නිලධාරීන් වෙත ලිඛිතව, වෙබ් අඩවිය හරහා දැනුම් දීමට කටයුතු කර ඇත. කෙසේ වුවද, එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන එක් එක් ආයතනය විසින් තම ආයතනයේ ගිණුම් සටහන් තැබීමෙන් අනතුරුව මාසික ගිණුම් සාරාංශ මගින් මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කරමින් තම ආයතන වල අත්තිකාරම් "බී" ගිණුම යටතේ වන විශ්‍රාමගිය හා මිය ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කර නොගැනීම හේතුවෙන් උක්ත තත්ත්වයක් පැන නැගී ඇති බව නිරීක්ෂණය විය.

02. අත්තිකාරම් "බී" ගිණුම යටතේ නිරවුල් නොවී ඇති මෙම ණය ශේෂ පිළිබඳව රාජ්‍ය ගිණුම් කාරක සභාවේ ද අවධානයට ලක් වී ඇති බැවින් 2018 ජනවාරි 01 වන දින සිට විශ්‍රාම ප්‍රතිලාභ සහිතව විශ්‍රාම ගනු ලබන සහ මියයන නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ නිරවුල් නොවී පවතින ණය ශේෂ පියවීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

I. (අ) මාර්ගගත (Online) විශ්‍රාම අයදුම්පතෙහි (PD03) සහ මරණ පාරිතෝෂික අයදුම්පතෙහි (PD05) අදාල ආයතනයේ අත්තිකාරම් "බී" ගිණුමෙහි අංකය සහ අදාල නිලධාරියාගෙන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට අයවිය යුතු සියලුම ණය ශේෂයන් යාවත්කාලීන කොට නිවැරදිව සටහන් කිරීම.

(ආ) අදාල නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට වන අයවීම් හැර රජයට අයවිය යුතු වෙනත් අයකිරීම් පිළිබඳ විස්තර, එම මුදල් බැර කල යුතු ආදායම් ශීර්ෂය හෝ අධිහාර කළ යුතු වැය ශීර්ෂය ද සහිතව නිවැරදිව සටහන් කිරීම.

(මෙම තොරතුරු දැක්වීමේ පහසුකම විශ්‍රාම වැටුප් අයදුම්පතෙහි (PD03/PD05) සලසා ඇත.)

II. උක්ත I (අ), (ආ) සඳහන් තොරතුරු පදනම් කරගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් යම් නිලධාරියකුගේ විශ්‍රාම/ මරණ පාරිතෝෂික ගෙවනු ලබන අවස්ථාවේදීම ණය ශේෂ නිරවුල් කිරීමට අදාල සටහන් ගිණුම් ගත කරමින් එම දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශය මගින් මහා භාණ්ඩාගාරයට වාර්තා කිරීම.


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk

III. අදාල නිලධාරියාගේ විශ්‍රාම/ මරණ පාරිතෝෂික ගෙවූ බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවියට ඇතුලත් කිරීම හා එම සටහන් ඇතුලත් කරමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මාසික ගිණුම් සාරාංශය මඟින් මහා භාණ්ඩාගාරයට වාර්තා කරන දත්ත ගිණුම්ගත කිරීමෙන් අනතුරුව නිකුත් කරනු ලබන භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (Table 67) පරීක්ෂා කොට තම ආයතනයට අදාලව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඇති ණය ශේෂ පියවීම් සියල්ලම තම ආයතනයේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ වන පාලන ගිණුම හා කේවල ශේෂ ලැයිස්තුවල (CC10) නිවැරදිව සටහන් කර ණය ශේෂ නිසි පරිදි පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කිරීම.

03. විශ්‍රාමගිය හා මියගිය නිලධාරීන්ට අදාල ණය ශේෂ විශ්‍රාම වැටුප් අයදුම්පතෙහි (PD03/PD05) නිවැරදිව ඇතුලත් කිරීම සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (Table 67) අනුව තම ආයතනයේ ගිණුම් පොත්පත් යාවත්කාලීන කර ගැනීම සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ ලේකම්වරයෙකු/ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු/ දිස්ත්‍රික් ලේකම්වරයෙකු හෝ හමුදා ප්‍රධානියෙකු විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු හෝ ගණන්දීමේ නිලධාරියෙකු ලෙස පෞද්ගලිකවම වගකීමට බැඳෙන බැවින් ඉහත 01 ඡේදයේ දක්වා ඇති විධිවිධාන සම්බන්ධයෙන් අවධානය යොමු කර කටයුතු කළ යුතුය.

04. මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කරමින් 2018 වර්ෂය සහ ඉදිරි වර්ෂවල විශ්‍රාම/ මරණ පාරිතෝෂික ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයක් තම ආයතනවල අත්තිකාරම් "බී" ගිණුමේ ඇතුලත් නොවීමට ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතුය.

05. පලාත් සභා වලට අදාල ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවන අතර දැනට පවත්නා විධිවිධාන තවදුරටත් අදාල කර ගත යුතුය.

06. විශ්‍රාමගිය හා මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි 2018 ජනවාරි 01 දින සිට කටයුතු කල යුතු බව කාරුණිකව දන්වමි.

07. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත නිකුත් කර ඇති මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා බාගත (download) කර ගැනීමේ පහසුකම් සලසා ඇති අතර තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2484735 මඟින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ.ඩී.එල්.ජී. කලන්සූරිය මහතා විමසන ලෙස ද දන්වා සිටිමි.

එස්.ජී. සේනාරත්න
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - 1.විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
2.අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3.අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
4.අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව